හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අභිතකර මතය

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ප්‍රමිතියේ පරිශිෂ්ය 02 හි ඊ.ජී 2.7අනුව ප්‍රාග්ධන වියදම් ප්‍රදාන එකවර ආදායමට හඳුනා නොගෙන ක්ෂය කිරීම් ගණනය කළ පදනම මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට සටහන් අංක 05 යටතේ දැක්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලැබී ඇති ප්‍රාග්ධන වියදම් ප්‍රදාන සියල්ලම අයභාරය ලෙස හඳුනාගෙන තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ පරිශිෂ්ය 02 හි ඊ.ජී 3.8 අනුව සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත උපකරණ ක්ෂය වෙනුවෙන් ක්ෂය කිරීමේ ක්‍රමය හා ක්ෂය අනුපාතය හෙළිදරව් කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	ප්‍රමිතියේ පරිශිෂ්ය 02 හි ඊ.ජී 4.22 අනුව දේශීය ණය සංවර්ධන අරමුදලේ දිගුකාලීන ණය ගැනීම්වලට අදාළව පොළී අනුපාතිකය, ණය මුදලේ කාල සීමාව, ණය මුදල ලබාගත් දිනය, ණය මුදල ගෙවිය යුතු දිනය, ණය මුදලේ කොන්දේසි, අරමුණු, ඇප හා විශේෂ කරුණු , මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඈ)	වාර්තා කරන දිනයේ සිට මාස 12 ක් ඇතුළත ගෙවිය යුතු වූ ණය ශේෂ 06 ක වටිනාකම රු.485,841 ක් ජංගම වගකීම් යටතේ හෙළිදරව් නොකර දිගු කාලීන වගකීම් යටතේ දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ඉ)	ප්‍රමිතියේ පරිශිෂ්ඨ 02 හි ඊ.ජී 4.6 අනුව සේවක ණය සහ අත්තිකාරම් ඇතුළු සියළුම වර්ගවල ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදනයන් ඇති කළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ පරිශිෂ්ඨය 02 හි ඊ.ජී. 2.7 ප්‍රකාරව රජයෙන් සහ වෙනත් පළාත් පාලන ආයතනවලින් ලද හා ලැබිය යුතු රු.73,130,224 ක මුළු ප්‍රදාන ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ දක්වා නොතිබුණි.	වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන යන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුල ලද ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වූ රු.50,575,362 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් යටතේ දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන යන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඇ)	2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලයට අදාලව ගිණුම්ගතව පැවති රු.2,361,466 ක් වටිනා ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂ 09 ක් ජ'නල් සටහන් 77 මගින් දෝශ සහගතව සටහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයගැති ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරියතවල ශුද්ධ අගය රු 6,221,374 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.5,634,576 ක් ලෙස රු.586,798 ක් අඩුවෙන්ද උපලේඛනය යටතේ දක්වා ඇති ඉකුත් වර්ෂවලදී ඉදිකරන ලද ඉදිකිරීම් 04 ක ශුද්ධ අගය රු.4,789,439 ක් සටහන් නොකිරීම මත දේපල පිරියත හා උපකරණ ශේෂය රු.5,376,237 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි මල අපවහන ගාස්තු ආදායම රු.186,950 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි කසල ගාස්තු ආදායම රු.257,496 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.136,152 ක් ලෙස	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

	රු.121,344 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.	
(උ)	සමාලෝචිත වර්ශයේ සහා අරමුදල් මඟින් ඉදිකළ ව්‍යාපෘති 2 කට අදාලව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.672,439 ක් දෝශ සහගතව ණයහිමියකු ලෙස දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිවැරදි හිඟ හිටි වෙළඳසැල් හා කඩ කුලී වටිනාකම රු.6,087,545 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.2,710,124 ක් ලෙස රු.3,377,421 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(එ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය අනුව සමුච්චිත අතිරික්තය රු.839,665,878 ක් වුවද වත්කම් හා වගකීම් ප්‍රකාශය තුලනය කිරීම සඳහා සමුච්චිත අතිරික්තය රු.836,528,402 ක් ලෙස දැක්වීම හේතුවෙන් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ සමුච්චිත අතිරික්තය රු.3,137,476 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඒ)	සමාලෝචිත වර්ෂයේ මිළදී ගන්නා ලද අයිතම 4ක සහ පරිත්‍යාග ලෙස ලද රෝද පුටුවක වටිනාකම ඇතුළුව රු.466,254 ක් දේපල පිරියත උපකරණ යටතේ ගිණුම්ගත නොකර ජංගම වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඔ)	සභාව දැනට භාවිතා කරන මනා පැවැත්මක් ඇති රු.47,299,970 ක පිරිවැය වූ වත්කම් අයිතම 310 ක ශුද්ධ අගයන් ශුන්‍ය වී තිබුණද, ප්‍රයෝජ්‍ය ජීව කාලය සංශෝධනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඕ)	සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී මිළදී ගත් භාණ්ඩ හා සේවා වෙනුවෙන් ගෙවිය යුතු වටිනාකම රු.1,206,698 ක්වූ ණයහිමි ශේෂ 07 ක් ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ක)	ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘති (LDSP) ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 02 ක සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු බිල්පත් වටිනාකම රු.19,663,476 ක් කර්මාන්ත ණයහිමි ලෙසත්, ලැබිය යුතු බිල්පත් වටිනාකම රු.13,864,039 ක් කර්මාන්ත ණයගැතියන් ලෙසත් ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

(ග)	සමාලෝචිත වර්ෂයේදී සිදුකළ ඉදිකිරීම් වටිනාකම රු.8,023,307 ක් වූ මාර්ග, පාලම් බෝක්කු 09 ක ශේෂයක්ද, වටිනාකම රු.58,780,245 ක්වූ ගොඩනැඟිලි ඉදිකිරීම් 04 ක ශේෂයක් ද දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ච)	සමාලෝචිත වර්ෂයේ ගිණුම්කරණ ප්‍රමිති වෙනසක් සිදුව නොතිබියදී, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශයේ අතිරික්තය රු.7,429,138 ක් ගිණුම් ප්‍රතිපත්ති වෙනස්වීම් ලෙස දක්වා එකතුකිරීම හේතුවෙන් සමුච්චිත අතිරික්තය එම ප්‍රමාණයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ජ)	ඉකුත් වර්ෂයේ සම්පිණ්ඩන විගණකාධිපති වාර්තාවේ ගිණුම්කරණ අඩුපාඩු අ (i) යටතේ රු.4,488,042 ක කර්මාන්ත ණයගැතියන් වැඩියෙන් දැක්වීම නිවැරදි කිරීමේදී රු.1,650,098 ක් දෝෂ සහගත ලෙස කර්මාන්ත ණයගැති ගිණුමට හර කර සමුච්චිත අරමුදලට බැරකර තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ට)	ජ'නල් සටහන් හා සමුච්චිත අරමුදල් ලෙජර ගිණුම අනුව පූර්ව කාල පරිච්ඡේදවල වැරදි නිවැරදි කිරීම සඳහා කළ හර හා බැර කිරීම් වල ශුද්ධ අගය රු.9,607,612 ක් වුවද එය ශුද්ධවත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ රු.29,122,685 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමුච්චිත අතිරික්තය රු.19,515,073 කින් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඩ)	සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව වර්ෂ අවසානයේ මුදල් හා මුදල් සමාන දෑවල වටිනාකම රු.21,505,615 ක සෘණ අගයක් වුවද සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ වත්කම් හා වගකීම් ප්‍රකාශය අනුව එම ශේෂය රු.30,695,031 ක් වූයෙන් එම ප්‍රකාශයේ රු.52,200,646 ක වෙනසක් විය.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ත)	සමාලෝචිත වර්ෂයේදී තැන්පත් කරන ලද රු.3,000,000 ක් වූ ස්ථාවර තැන්පතු වටිනාකම හා ලැබූ සේවක ණය පොළිය රු.347,441 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ද)	සමාලෝචිත වර්ෂයේදී රු.2,837,034 ක් වූ දේපල පිරියත හා උපකරණ මිළදී ගැනීම් හා ඉදිකිරීම් වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
	ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.		
(ඉ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස්කම් යටතේ දැක්වෙන අගයන් හා වත්කම් වගකීම් ප්‍රකාශයේ දැක්වෙන අගයන් අතර රු.6,595,738 ක වෙනසක් පැවතුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඊ)	වටිනාකම රු.1,613,201 ක් වූ ගිණුම් ශේෂ 02 ක් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ තුලට ඇතුළත් කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ශේෂ 13 ක රු. 88,704,978 ක් මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා උපලේඛන අනුව ශේෂයන් අතර නොසැසඳීමක් විය.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	ගිණුම් පොත්පත් සැසඳීම් කර නිවැරදි අගයන් සටහන් කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් 10 ක ශේෂයන් හා ශේෂ පිරික්සුම අනුව එම ශේෂයන් අතර රු.10,639,888 ක නොසැසඳීමක් විය.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	ගිණුම් පොත්පත් සැසඳීම් කර නිවැරදි අගයන් සටහන් කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා උපයෝගී කරගත් ලෙජර ගිණුම් 17ක රු.68,317,962 ක එකතු කිරීමේ දෝෂ පැවති අතර එම දෝෂ සහිතව ශේෂ පිරික්සුම පිළියෙල කර තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පොත්පත් පිළියෙල කළ යුතුය.

1.6.4 අධිකාරි බලය නොලත් ගනුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ 06 ක පැවති වෙනස්කම් නිවැරදි කිරීම සඳහා මුළු වටිනාකම රු.13,842,208 ක් සඳහා ජ'නල් සටහන් යොදා වත්කම් ශේෂයක අගය රු.1,417,267 කින් කපා හැරීමටත්, වත්කම් ශේෂ 03 ක අගය රු.905,337 කින් වැඩිකිරීමටත්, වගකීම් ශේෂ 02ක අගය රු.11,499,593 කින් වැඩි කිරීමටත් කටයුතු කර තිබුණද මෙම වෙනස්කම් මොනවාද යන්න නිශ්චිතව හඳුනාගෙන නොතිබූ අතර කපා හැරීම සඳහා නිසි අනුමැතියද ලබාගෙන නොතිබුණි.	2025 වර්ෂය වෙනුවෙන් සකස් කරන මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් ශේෂ නිශ්චිතව හඳුනාගෙන කපාහැරීම් සඳහා නිසි අනුමැතියද ලබාගත යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රීති හා ප්‍රඥප්ති විධිවිධාන			
(i)	1946 අංක 30 දරණ බදු හා තක්සේරු ආඥා පනතේ 20 වගන්තිය	ප්‍රාදේශීය සභාව විසින් 2017 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදීද වරිපනම් අය කර තිබුණි.	පලාත් විෂය භාර අමාත්‍යවරයා විසින් එවකට රටේ පැවති වසංගත තත්වය හේතුවෙන් වරිපනම් ප්‍රතිශෝධන තක්සේරු කිරිම සුදුසු නොවන බව දන්වා තිබූ බව.	පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	1988 අංක 56, 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධනය වූ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" කොටස	සභාව විසින් නඩත්තු කර පවත්වාගෙන යනු ලබන අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.	පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ඉල්ලුම් කර ඇති බව.	පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xxiv වැනි පරිච්ඡේදයේ 4.2.3 හා 4.3, 4.4 , 4.4.1 හා 4.5 ඡේද සහ 2019 ජූලි 27 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 03 ඡේදය	මියගිය, විශ්‍රාමගිය, වැඩ තහනම් වු, සේවයෙන් ඉවත්කළ, සේවය හැර ගිය නිළධාරින් 48 දෙනෙකුගෙන් අයවිය යුතු රු.406,145 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	කමිටුවක් පත්කර ඇති අතර වාර්තාව ලැබුණු පසු කඩිනමින් අදාල අයගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කරන බව.	ආයතන සංග්‍රහය සහ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			

(i)	මු.රෙ. 104	සභාවට අයත් කැබ් රථයක 2015 අප්‍රේල් 14 වන දින සභාවේ සභාපතිවරයා ගමන් කරමින් සිටියදී අනතුරට පත්ව පූර්ණ හානියට පත්වී තිබුණද මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර පූර්ණ වාර්තාවක් ලබා දී නොතිබුණි.	කමිටුවක් පත්කර ඇති අතර වාර්තාව ලැබුණු පසු කඩිනමින් අදාල අයගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	මු.රෙ. 257	සෑම වවුචරයකම බලයලත් නිළධාරියා විසින් වියදම සහතික කළ යුතු වුවත් රු.9,884,074 ක වවුචර්පත් 14 කට අදාලව එසේ කටයුතු කර නොතිබුණි.	විෂය නිලධාරි වෙත අවවාද කරන ලද බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(iii)	මු.රෙ. 395 (ඇ)	එක් එක් මාසය අවසානයේ දී ඇති ගණුදෙනු තත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.12,638,351 ක ශේෂයකට අදාළව 2024 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කර මාස 06ක් ප්‍රමාද වී විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර රු.3,924,177ක ශේෂයකට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට සකස් කර ඇති බව.	නියමිත දිනට බැංකු සැසඳුම පිළියෙල කළ යුතුය.
(iv)	මු.රෙ. 571(2)	කර්මාන්ත හා විවිධ තැන්පතු ලෙස දක්වා ඇති තැන්පතු කාලය වර්ෂ 02 ඉක්මවා ඇති රු.1,463,239 ක ඉකුත් තැන්පතු 17 ක් නියාදනය කර නොතිබුණි.	වසර දෙක ඉක්මවූ තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 3.1 වගන්තිය	සභාවේ වාහන 07 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.	ඉන්ධන පරීක්ෂාව සිදු කරනු ලබන බව.	ඉන්ධන පරීක්ෂාව සිදු කළ යුතුය.

(ඉ) 2021 අප්‍රේල් 21 දිනැති අංක 2019/02 (1) දරණ උතුරුමැද පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 2 ඡේදය	රු 4,305,519 ක පුස්තකාල පොත් ශේෂය වත්කම් හා වගකීම් ප්‍රකාශය තුල හදුනානොගෙන ගිණුම්කරණ සටහන් තුල පෙන්නුම් කළ යුතු වුවත්, ඊට පටහැනිව දේපල පිරියත උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.20,168,795 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 2,159,041 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරිය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	10,351,091	10,780,302	7,883,996	5,746,709	10,351,091	9,300,151	8,086,473	2,850,403
(ii)	කුලී	34,127,174	17,067,532	17,881,350	11,602,478	34,469,004	14,194,996	15,524,102	12,416,296
(iii)	බලපත්‍ර ගාස්තු	2,249,250	2,999,895	3,123,918	1,029,760	2,222,500	2,442,490	2,310,120	1,153,783
(iv)	වෙනත් ආදායම්	10,732,385	10,956,589	16,097,172	1,354,677	11,126,145	9,486,450	8,147,476	6,495,260
		57,459,900	41,804,318	44,986,436	19,733,624	58,168,740	35,424,087	34,068,171	22,915,742

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වරිපනම්		
සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට අයකර ගත යුතු හිඟ වරිපනම් රු.4,478,376 ක් වුවද සමාලෝචිත වර්ෂය තුල ඉන් සියයට 29 ක් එනම් රු.1,321,219 ක් හා සමාලෝචිත වර්ෂයට අදාල බිල් කළ	විවිධ නීතිමය ගැටළු හේතුවෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි වූ බව.	2020 මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු රිති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

ආදායම වූ රු.8,277,836 කින් අයකල ප්‍රමාණය සියයට 69 ක් විය. වරිපනම් ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධයෙන් 2020 මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 287 ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් වරිපනම් හිඟය ඉතා විශාල අගයක් දක්වා වර්ධනය වී තිබුණි.

(ආ) කුලී

(i)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 3 කට වැඩි කාලයක සිට අයකිරීමට පැවති කඩ ඒකක 191 කින් අයවිය යුතු හිඟහිටි කඩකුලී ශේෂය රු.6,087,545 ක් විය.	හිඟ ශේෂයන් ඇති අයගේ කඩ කාමර මුද්‍රා තබා සභාව වෙත පවරා ගෙන හිඟයන් අය කිරිම සඳහා අධිකරණයට වාර්තා කිරිමට සටහන් කර ගනු ලැබූ බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලයට අදාලව වාහන හා යන්ත්‍ර කුලියට දීම මගින් අයවිය යුතු හිඟ ශේෂය රු.5,515,593 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේදී ද අදාල හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පරීක්ෂණ කමිටුවක් පත් කර ඇති බව හා වාර්තාව අනුව එම අලාභය අය කර ගැනිමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර කුලි පදනම මත ලබා දී, අයවිය යුතු රු.3,122,898 ක් අදාළ ව්‍යාපෘතිය අවසන් කර වර්ෂ 02 ක් ගත වුවත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පරීක්ෂණ කමිටුවක් පත් කර ඇත වාර්තාව අනුව එම අලාභය අය කර ගැනිමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු පිළිවෙලින් රු.332,550ක් , රු. 493,350ක්, හා රු.203,860 ක් අයකරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	බොහෝමයක් ව්‍යාපාර වසා දමා ඇති බවත් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විධිමත්ව කපා හැරීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට හෝ විධිමත්ව කපා හැරීමට කටයුතු කළ යුතුය.

(ඈ) වෙනත් ආදායම්

(i)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි මළ අපවහන ගාස්තු රු.382,860 ක්, හිඟ ජල ගාස්තු රු.839,665 ක් හා හිඟ කසල බදු රු.136,152 ක් වශයෙන් රු.1,358,677 ක් අය කරගෙන නොතිබුණි.	හිඟ අය කර ගත හැකි මුදල් අයකර ගැනීමටත් අනෙකුත් ඒවා සඳහා නීතිමය කටයුතු සිදු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ii)	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ලෙස දක්වා තිබුණු උසාවි දඩ රු.52,417,397 ක් හා මුද්දර ගාස්තු රු.31,454,267 ක් විය.	උසාවි දඩ හා මුද්දර ගාස්තු මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලබන බව.	උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
අතුරු ව්‍යවස්ථා		
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 23 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යාවස්ථා පැනවිය හැකි වුවද 2024 දෙසැම්බර් 31 දින වන විට ප්‍රධාන කරුණු 08 ක් වෙනුවෙන් අතුරු ව්‍යාවස්ථා පනවාගෙන නොතිබුණි.	ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව.	ප්‍රධාන කරුණු වෙනුවෙන් අතුරු ව්‍යාවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද හිඟුරක්ගොඩ පොදු වෙළඳපොළ කඩ කාමර 65 න් 35 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ගිවිසුම්ගත ප්‍රතිලාභීන් විසින් විවෘත කර නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව සභාව විසින් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2025 වර්ෂයේ මුද්‍රා තැබීමට හා කඩ කාමර පවරා ගැනීමට ආණ්ඩුකාර උපදෙස් මත ක්‍රියාකළ බවත් කඩකාමර 02 ක් හැර අනෙක් කඩකාමර විවෘත කර ඇති බව.	කඩ කාමර ගිවිසුම් ප්‍රකාරව විවෘත කර තැබිය යුතුය.
(ආ)	ආදාහනාගාර භාරකරු විසින් ඉකුත් වර්ෂවලට අදාලව ආදාහනය කරන ලද මෘත දේහ 08 කට අදාල රු.76,000 ක ආදායමක් සභාව වෙත ගෙවා නොතිබීම සහ 2021 අප්‍රේල් 07 දින ගෑස් සිලින්ඩර් 10 ක් මිලට ගත් බවට පෞද්ගලික ආයතනයකින් ලබාගත් රු. 62,310 ක සාවද්‍ය බිල්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධව සමාලෝචිත වර්ෂයේදී ද විනයානුකූලව කටයුතු කර නොතිබුණි.	පරීක්ෂණ කටයුතු පළාත් පාලන දෙපාර්තමේන්තුව පත්කළ මණ්ඩලයක් විසින් සිදු කරන බව.	පරීක්ෂණ කටයුතු කඩිනමින් සිදු කරවා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඇ)	වාහන රක්ෂණය සඳහා රු.34,795,000 කට තක්සේරු කර තිබුණු පිරියත හා යන්ත්‍ර 05 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදි කරන බව.	තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය.
(ඈ)	බල ප්‍රදේශයේ ජනනය වන කසල කළමනාකරණය සඳහා ප්‍රාදේශීය සභාව වෙත අක්කර 25 ක බිම් කොටසක් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් රොටවැව ග්‍රාම නිලධාරි වසමෙන් 2019 වර්ෂයේදී වෙන්කර දී ඇති නමුත් අදාල රාජ්‍ය ආයතන සමඟ කටයුතු කර එම ඉඩම නිරවුල් කර ගැනීමට හා විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.	රොටවැව කසළ අපහරණ භූමිය අප සභාව වෙත ලබා නොදෙන බව.	විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කර ගත යුතුය.
(ඉ)	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් 2024 මැයි මස නිකුත් කර ඇති පළාත් පාලන ආයතන මාර්ගෝපදේශ අංක 01 හි 5.2.3 ප්‍රකාරව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් පරිදි ඒකකයක් සභාව තුළ පිහිටුවීමකින් තොරව වාහන අංගනයේ නොදිරන කසල රැස් කිරීම සිදු කර තිබූ අතර මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.3.1 (V) ප්‍රකාරව දිරන කසල භාවිතයෙන් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට ප්‍රමුඛතාවය ලබාදිය යුතු වුවත්, සභාව මගින් රැස් කරනු ලබන දිරන කසල භාවිත කර කොම්පෝස්ට් නිෂ්පාදනය සිදු කර නොතිබුණි.	කාර්ය සිදු කිරීම සඳහා දැනට වෙනත් ස්ථානයක් නොමැති බැවින් තාවකාලිකව කසළ එක්රැස් කරන මධ්‍යස්ථානයක් ලෙස මෙය භාවිතා කරනු ලබන බව.	ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කළ යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	වටිනාකම රු.79,777,050 ක් වූ සභාව සතු ගොඩනැගිලි 03 ක් හා වාහන හා යන්ත්‍ර 07 ක් වසර 05 කට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.	ඉල්ලීම් නොමැති වීම මත නිල නිවාස ඌණ උපයෝජිතව ඇති අතර, වාහන අළුත්වැඩියා කර ප්‍රායෝජනයට ගැනීමට හෝ අපහරණයට කටයුතු කරන බව.	වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	රුපියල් මිලියන 27.15 ක් වැය කර පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ 2019 වර්ෂයේ ඉදිකර හිඟුරක්ගොඩ පොදු වෙළඳපොල කුලියට දීම සඳහා ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව සභාපතිවරයා හා සභාව විසින් ගනු ලැබූ තීරණ හේතුවෙන් කුලියට ලබා දීම ප්‍රමාදවීම මත වර්ෂ 05 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පවතින අතර ඒ අනුව තක්සේරු කුළිය මත 2022 වර්ෂයේ සිට සභාවට අහිමි වූ ආදායම රු.37,301,600 ක් විය.	පිබිදෙමු පොළොන්නරුව වැඩසටහන මගින් ඉදිකර භාරදෙන අවස්ථාවේදීද අසම්පූර්ණ වැඩකොටස් රාශියක් තිබූ අතර කඩකාමර ලබාදීමේදි මින් පෙර වූ එකඟතාවයන් වල ගැටළුද ඇති බව.	කඩකාමර අඩුපාඩු සම්පූර්ණ කර ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතුව පවතින වාහන හා යන්ත්‍රෝපකරණ 38 ක් ගාල් කිරීම සඳහා ආරක්ෂිත ආවරණයක් නොපැවතුණි.	වාහන අංගනයක් ඉදිකිරීමට නියමිත බව.	වාහන අංගනයක් ඉදිකර ආරක්ෂාව තහවුරු කළ යුතුය.
(ආ)	සභාව සතුව ධාවනයෙන් තොරව පවතින හා අළුත්වැඩියා මට්ටමේ පවතින වාහන හා යන්ත්‍ර 7 ක් සම්බන්ධව අළුත්වැඩියා කටයුතු වර්ෂ 03 කට අධික කාලයක සිට ප්‍රමාදව පැවතුණි.	කටයුතු සිදු කරමින් පවතින බව.	වාහන හා කොටස් අළුත්වැඩියා කර භාවිතයට ගත යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ ලේකම් තනතුර වසර 05 ක සිට පුරප්පාඩුව පවතින අතර වැඩ බලන ලේකම්වරුන් විසින් එම තනතුරේ රාජකාරී ආවරණය කරමින් පැවතුණි.	පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කළ යුතු බව.	පුරප්පාඩුව සම්පූර්ණ කරවා ගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සභාවේ සංවර්ධන නිලධාරි තනතුරු 02 ක, පුස්තකාලාධිපති තනතුරු 03 ක, කාර්මික නිලධාරී තනතුරක, කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 02 ක, වෙළඳපොළ සුපරීක්ෂක තනතුරක, වැඩ/ක්ෂේත්‍ර සුපරීක්ෂක තනතුරක, සෞඛ්‍ය සුපරීක්ෂක තනතුරක, රියදුරු තනතුරු 07 ක, බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුරක, මුරකරු තනතුරු 03 ක, ජල කම්කරු තනතුරු 03 ක, ක්‍රීඩා භූමි පාලක තනතුරුක හා සෞඛ්‍ය කම්කරු තනතුරු 03 ක පුරප්පාඩු 29 ක් පැවතුණු බැවින් සභාවේ කටයුතු මනා කාර්යක්ෂමතාවයකින් යුතුව සිදු කිරීමට නොහැකි වී තිබුණි.	පුරප්පාඩු සම්බන්ධව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති බව.	පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2015 මාර්තු 18 දිනැති අංක 4/2015 දරණ උතුරුමැද පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයෙහි 1.3 ප්‍රකාරව සභාව විසින් අභ්‍යන්තර විගණන නිළධාරියෙකු පත්කර සෑම මසකම අවසානයේදීම මහා සභාවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද කාර්තුවකට වරක් පමණක් විගණන වාර්තාවන් සකස් කර තිබුණි. එම වාර්තාවේ පිටපත් විගණකාධිපති වෙත යොමු කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන නිලධාරී වෙත විගණන රාජකාරියට අමතරව වවුචර් පරීක්ෂා කිරීමේ රාජකාරියද පවරා තිබුණි.	ඉදිරියේදි නිවැරදි කර ගන්නා බව.	චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

4.2 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ පරීක්ෂාවේදී ආදායම් විෂයන් 05ක සියයට 15 සිට සියයට 87 දක්වාද විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය මහපෙන්වීමක් ලෙස භාවිතා කර නොතිබුණි.	පිළිගන්නා බව.	අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය මහපෙන්වීමක් ලෙස භාවිතා කළ යුතුය.
(ආ)	වාර්ෂික අයවැය ලේඛනයේ දක්වා තිබුණු වටිනාකම රු.5,800,000 ක් වූ ව්‍යාපෘති 05 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.	ඇස්තමේන්තු අනුමත නොවීම මත 2025 වර්ෂයේ අය වැය ලේඛනයටද මෙම ව්‍යාපෘති ඇතුලත් කර ඇති බව.	සැලසුම් කළ ව්‍යාපෘති අදාළ වර්ෂය තුල ක්‍රියාත්මක කළ යුතුය.

4.3 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ නියාමනය අනුව ප්‍රාදේශීය සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු, වැඩසටහන් හා නිර්ණායක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමක් සිදු කර නොතිබුණි.	වැඩසටහන් සංවිධානය කර ඇති බව.	පනතේ දක්වා ඇති අරමුණු හා වැඩසටහන් වලට අදාල වන පරිදි කටයුතු කළ යුතුය.